Department of Education,Sabaragamuwa Province/ Weekly School

**පාඩම: විකසනය**

1. <u>සිලින්ඩරයක විකසනය ඇඳීම</u>

   අරය 30 mm හා උස 50 mm වන සිලින්ඩරයක විකසනය අඳිමු.

   I. මෙහිදී පළමුව සිලින්ඩරයේ සැලැස්ම වන අරය 30mm වන වෘත්තය ඇඳ එය සමාන කොටස් 12කට බෙදා ගත යුතුය. ඒ සඳහා චාප ක්‍රමය යොදා ගත හැකිය.


   II. ඉන් පසු තිරස් රේඛාවක් ඇඳ ඒ මත බෙදා ගත් පරිධියේ කොටසක දුර කවකටුවකට ගෙන කොටස් 12 ක් ලකුණු කරන්න.

   III. එම ලක්ෂ 12න් රේඛාවට ලම්භක රේඛා අඳින්න.


   IV. අඳින ලද ලම්බක රේඛා මත සිලින්ඩරයේ උස එනම් 50 mm බැගින් ලකුණු කර යා කරන්න.

   V. සුදුසු ස්ථානයකින් පියන සහ පතුළ අඳින්න.


   වෘත්තය කොටස් 12කට බෙදීම :-



විකසනය ඇඳීම:-




2. <u>ලුප්ත ( ඡේදිත ) ඝනවස්තු වල විකසනය ඇඳීම</u>



රූපයේ දැක්වෙන ලුප්ත ප්‍රිස්මයේ විකසනය අඳිමු.

I. තිරස් රේඛාවක් ඇඳ දිග හා පළල මිණුම් ලකුණු කරන්න.

II. ලකුණු කළ ලක්ෂ වලින් ලම්භක රේඛා අඳින්න.

III. පළමු රේඛා දෙකෙහි හා අවසාන රේඛාවෙහි 30mm බැගින් ලකුණු කරන්න.

IV. තුන්වන හා හතරවන රේඛා වලද 40mm බැගින් ලකුණු කරන්න. එම ලක්ෂ යා කරන්න.

V. පතුළ නිර්මාණය කර විකසනය නිමා කරන්න.

